ශ්‍රී ලාංකික ජනතාවගේ සහ දේශයේ සෞභාග්‍ය වෙනුවෙන්
කැප වී සිටින අප සමග හවුල්කරුවකු වන්නට
ඔබත් කැමතිද?

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

නිපුණතා පූර්ණ තරුණ තරුණියන් සඳහා
ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ රැකියා අවස්ථා

දිවයින පුරා ශාඛා 272 ක් සහ 3000 ට වැඩි ශ්‍රම බලකායකින් යුත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය සංවර්ධන බැංකුව වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පුරප්පාඩුව ඇති පහත තනතුර සඳහා සුදුසුකම් සහිත නිපුණතාපූර්ණ සහ කාර්ය ශූර තරුණ තරුණියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

කළමනාකරණ අභ්‍යාසලාභී

අවශ්‍ය සුදුසුකම්

පිළිගත් විශ්වවිද්‍යාලයකින් පංති සාමාර්ථයක් සහිතව බැංකුකරණය සහ මූල්‍ය, කළමනාකරණය (රාජ්‍ය/ ව්‍යාපාර පරිපාලනය) ගණකාධිකරණය, වාණිජ විද්‍යාව, ආර්ථික විද්‍යාව, කෘෂිකර්ම විද්‍යාව, මානව සම්පත් කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, විද්‍යාව, ගණිතය, අලෙවිකරණය, නීතිය, සංඛ්‍යානය හෝ දේපළ තක්සේරුව පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම

හෝ.

සාමාන්‍ය සාමාර්ථයක් සහිතව ඉහත ක්ෂේත්‍රයක විශේෂ උපාධියක් සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බැංකුකරණය හා මූල්‍ය පිළිබඳව ඩිප්ලෝමාව හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ Business Level II හෝ සමාන සුදුසුකමක්

හෝ

ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ / එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනය / එක්සත් රාජධානියේ වරලත් සහතික කළ ගණකාධිකාරීන්ගේ සංගමයේ අවසාන විභාග සමත් වීම හෝ සමාන සුදුසුකමක්

පරිගණක තාක්ෂණය හා දෙවන භාෂාවකින් කටයුතු කිරීමේ හැකියාව සහිත අයදුම්කරුවන් හට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

ප්‍රජාමූල කටයුතු පිළිබඳව මනා අවබෝධයක් ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

වයස

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 28 ට නොවැඩි විය යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2022/03/02 වේ

තෝරා ගැනීමේ පටිපාටිය

තරග විභාගයෙන් සහ සම්මුඛ පරීක්ෂණ මගින් තෝරාගනු ලැබේ. ලිඛිත විභාගය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වේ.

විෂය	මාධ්‍යය
විශ්ලේෂණ දක්ෂතා හා බුද්ධි පරීක්ෂණය	සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි
සාමාන්‍ය දැනීම	සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි
ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පරීක්ෂණය	ඉංග්‍රීසි

පුහුණුව සහ පත්වීම් ලබා දීම

පත්වීම්ලාභීන් වසර දෙකක කාලයක් පුහුණුවීම අවශ්‍ය වේ. එම වසර දෙකක කාලය තුළ සෑ මාසික ඇගයීමට ලක් කරනු ලැබේ. සාර්ථක ලෙස වසර දෙකක පුහුණු කාලය නිමා කරන පුහුණුලාභීන් නිලධාරී IV ශ්‍රේණිය සඳහා ස්ථිර සේවක මණ්ඩලයට බඳවා ගනු ලබන අතර, රු 54,635-750X3 - 56,885/- මාසික වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ පිහිටවනු ලැබේ. (මාසික දළ වැටුප රු: 115,144./- ක් වනු ඇත.)

පරිවාස කාලය

වසරක පරිවාස කාලය (වසර දෙකක පුහුණු කාලයෙන් පසු ගණනය කරනු ලැබේ) සහ පරිවාස කාලය තුළ කාර්ය සාධනයේ ඇගයීමට යටත්ව සේවයේ ස්ථිර කිරීම සිදු කරනු ලැබේ.

ගෙවීම්

පළමු වසරේ පුහුණු කාලය තුළදී කොන්ත්‍රාත් පදනම මත රු: 40,000/- ක (සියලු දේ ඇතුළත්) ස්ථාවර මාසික දීමනාවක් අභ්‍යාසලාභීන්ට ගෙවනු ලබන අතර, දෙවන වසරේ පුහුණු කාලය තුළදී රු: 45,000/- ක (සියලු දේ ඇතුළත්) මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

අයදුම්පත් යොමු කිරීම

ඔබගේ අයදුම්පත මාර්ගගත (On line) ක්‍රමයට ඉදිරිපත් කිරීම සඳහා අපගේ "https://www.rdb.lk/careers" යන වෙබ් පිටුව වෙත පිවිස එහි "Application for the post of Management Trainee" තෝරාගන්න.

Careers තීරයේ ඇති "Instructions to Candidates" යටතේ ඇති ගොනුව හොඳින් කියවා ලබා දී ඇති උපදෙස් අනුව මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කරන්න.

තරග විභාගයට ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

ඉහත අයදුම්කිරීමේ පටිපාටියෙන් බැහැර ව වෙතත් කිසිදු ක්‍රමයකින් ලැබෙන අයදුම්පත් කිසිදු හේතුවක් නිසා භාරගනු නොලැබේ.

ඉහත සඳහන් කරන ලද සුදුසුකම් සපුරාලීමට අසමත්වන හෝ වැරදි තොරතුරු ඇතුළත් අයදුම්පත් මෙම බඳවාගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවකදී කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මේ සම්බන්ධයෙන් සිදු කෙරෙන ඕනෑම ආකාරයක බලපෑමක් හෝ වැරදි තොරතුරු ඉදිරිපත් කිරීමක් මෙම තනතුර සඳහා තෝරා ගැනීමට නුසුදුසුකමක් වේ.

තෝරාගත් අයදුම්කරුවන් පමණක් කැඳවීමේ සහ මෙම බඳවාගැනීම කල් තැබීම හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank

ප්‍රධාන මානව සම්පත් නිලධාරී,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැලණිය.
0112 42 52 62 | www.rdb.lk